# සිංහල

## වැඩ පොත

## 2 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
**www.edupub.gov.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.

පළමුවන මුද්‍රණය - 2016
දෙවන මුද්‍රණය - 2017
තුන්වන මුද්‍රණය - 2018
සිවුවන මුද්‍රණය - 2019

ISBN 978-955-25-0228-6

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා

ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා

අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා

පිළිගනු මැන අප භක්ති පූජා

නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

ඔබ වේ අප විද්‍යා ඔබ ම ය අප සත්‍යා

ඔබ වේ අප ශක්ති අප හද තුළ භක්ති

ඔබ අප ආලෝකේ අපගේ අනුප්‍රාණේ

ඔබ අප ජීවන වේ අප මුක්තිය ඔබ වේ

නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා

ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා

එක මවකගෙ දරු කැල බැවිනා

යමු යමු වී නොපමා

ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්



"අලුත් වෙමින්, වෙනස් වෙමින්, නිවැරදි දැනුමෙන්
රටට වගෙ ම මුළු ලොවට ම වෙන්න නැණ පහන්"

# ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය


ගෙවී ගිය දශක දෙකකට ආසන්න කාලය ලෝක ඉතිහාසය තුළ සුවිශේෂී වූ තාක්ෂණික වෙනස්කම් රැසක් සිදුවූ කාලයකි. තොරතුරු තාක්ෂණය, සන්නිවේදනය ප්‍රමුඛ කරගත් සෙසු ක්ෂේත්‍රවල ශීඝ්‍ර දියුණුවත් සමඟ වත්මන් සිසු දරු දැරියන් හමුවේ නව අභියෝග රැසක් නිර්මාණය වී තිබේ. අද සමාජයේ පවතින රැකියාවල ස්වභාවය නුදුරු අනාගතයේ දී සුවිශේෂී වෙනස්කම් රැසකට ලක් වනු ඇත. එවන් වටපිටාවක් තුළ නව තාක්ෂණික දැනුම සහ බුද්ධිය කේන්ද්‍ර කරගත් සමාජයක වෙනස් ආකාරයේ රැකියා අවස්ථා ද ලක්ෂ ගණනින් නිර්මාණය වනු ඇත. ඒ අනාගත අභියෝග ජයගැනීම වෙනුවෙන්, ඔබ සවිබල ගැන්වීම අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස මගේත්, අප රජයේත් ප්‍රමුඛ අරමුණයි.

නිදහස් අධ්‍යාපනයේ මාහැඟි ප්‍රතිලාභයක් ලෙස නොමිලේ ඔබ අතට පත් වන මෙම පොත මනාව පරිශීලනය කිරීමත්, ඉන් අවශ්‍ය දැනුම උකහා ගැනීමත් ඔබේ ඒකායන අරමුණ විය යුතු ය. එමෙන් ම ඔබේ මවුපියන් ඇතුළු වැඩිහිටියන්ගේ ශ්‍රමයේ සහ කැපකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය විසින් නොමිලේ පාසල් පෙළපොත් ඔබ අතට පත් කරනු ලබන බව ද ඔබ වටහා ගත යුතු ය.

ලෝකය වේගයෙන් වෙනස් වන වටපිටාවක, නව ප්‍රවණතාවලට ගැළපෙන අයුරින් නව විෂය මාලා සකස් කිරීමටත්, අධ්‍යාපන පද්ධතිය තුළ තීරණාත්මක වෙනස්කම් සිදු කිරීම සඳහාත් රජයක් ලෙස අප කටයුතු කරන්නේ රටක අනාගතය අධ්‍යාපනය මඟින් සිදු වන බව අප හොඳින් ම අවබෝධ කරගෙන සිටින බැවිනි. නිදහස් අධ්‍යාපනයේ උපරිම ප්‍රතිඵල භුක්ති විඳිමින්, රටට පමණක් නොව ලොවට ම වැඩදායී ශ්‍රී ලාංකික පුරවැසියකු ලෙස නැඟී සිටින්නට ඔබ ද අදිටන් කරගත යුතු වන්නේ එබැවිනි. ඒ සඳහා මේ පොත පරිශීලනය කිරීමෙන් ඔබ ලබන දැනුම ද ඉවහල් වනු ඇති බව මගේ විශ්වාසයයි.

රජය ඔබේ අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරන අතිවිශාල ධනස්කන්ධයට වටිනාකමක් එක් කිරීම ද ඔබේ යුතුකමක් වන අතර, පාසල් අධ්‍යාපනය හරහා ඔබ ලබා ගන්නා දැනුම හා කුසලතා ඔබේ අනාගතය තීරණය කරන බව ද ඔබ හොඳින් අවබෝධ කර ගත යුතු ය. ඔබ සමාජයේ කුමන තරාතිරමක සිටිය ද සියලු බාධා බිඳ දමමින් සමාජයේ ඉහළ ම ස්තරයකට ගමන් කිරීමේ හැකියාව අධ්‍යාපනය හරහා ඔබට හිමි වන බව ද ඔබ හොඳින් අවධාරණය කර ගත යුතු ය.

එබැවින් නිදහස් අධ්‍යාපනයේ උපරිම ප්‍රතිඵල ලබා, ගෞරවනීය පුරවැසියකු ලෙස ඔබට හෙට ලොව දිනන්නටත් දේශ දේශාන්තරවල පවා ශ්‍රී ලාංකේය නාමය බබළවන්නටත් හැකි වේවා! යි අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස මම ශුභ ප්‍රාර්ථනය කරමි.



අකිල විරාජ් කාරියවසම්
අධ්‍යාපන අමාත්‍ය

# පෙරවදන

ඔබ ජන්මලාභය ලබා ඇත්තේ ඉන්දීය සාගරයේ මුතු ඇටය යැයි විරුදාවලී ලත් රටකය. ඔබේ රට අන් රටවල් හා සැසඳූ කල කුඩා රටක් ලෙස පෙනුණද එහි අගය අමිල ය. එවන් අගනා පුණ්‍යභූමියක උපන් ඔබ සැම සැබවින්ම වාසනාවන්ත පිරිසකි. සිසු දරුදැරියන් වන ඔබ සැම, හොඳින් අධ්‍යාපනය ලබා ගුණ නැණ බෙලෙන් යුතු පුරවැසියන් ලෙස අනාගත ලෝකය එළිය කරනු දැකීම අපගේ ඒකායන අපේක්ෂාවයි. එම අපේක්ෂාව මුදුන්පත් කරලනු පිණිස අධ්‍යාපනය සඳහා අවශ්‍ය සියලු පහසුකම් නොමිලේ සැපයීමට රජය කටයුතු කරයි. මෙම පොත ඔබට තිළිණ කෙරෙන්නේ ද එහි එක් පියවරක් වශයෙනි.

නව ප්‍රාථමික විෂය මාලාවට අනුව මේ වන විට 1, 2, 3 සහ 4 ශ්‍රේණි සඳහා නව පෙළපොත් හඳුන්වා දී ඇත. 2020 වර්ෂයේ දී 5 වැනි ශ්‍රේණියට නව පෙළ පොත් හඳුන්වා දීමෙන් අනතුරුව මෙම අදියරේ ප්‍රාථමික විෂයමාලා සංශෝධනය නිමාවට පත්වේ. 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ප්‍රාථමික ශ්‍රේණිවල සිප් සතර හදාරන ශිෂ්‍ය ප්‍රජාව වෙනුවෙන් රජය තිළිණ කරන පෙළපොත් සංඛ්‍යාව 30 ක් පමණ වේ. මේ වටිනා සම්පතින් ජීවිතය ආලෝකවත් කර ගැනීමට කටයුතු කිරීම ඔබ සැමගේ වගකීම විය යුතුය.

මෙම පෙළපොත ඔබ අතට පත් කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කළ ලේඛක හා සංස්කාරක මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන්ට සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කරමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක,**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2019.04.10

## නියාමනය හා අධීක්ෂණය

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක මයා | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

## මෙහෙයවීම

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි මිය | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

## සම්බන්ධීකරණය

| | | |
|---|---|---|
| ඩබ්ලිව්.ඩී. පද්මිණි නාලිකා මිය | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| ප්‍රගීතිකා ජයසේකර මිය | - | සහකාර කොමසාරිස්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

## සංස්කාරක මණ්ඩලය

| | | |
|---|---|---|
| ජේ. බී. දිසානායක මයා | - | සම්මානිත මහාචාර්ය |
| එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන<br>දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය,<br>මහරගම. |
| ජේ. ඒ. නිර්මලා දමයන්ති ජයසිංහ මෙය | - | සහකාර කථිකාචාර්ය,<br>මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන<br>දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය,<br>මහරගම. |

## ලේඛක මණ්ඩලය

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. කරුණාරත්න මයා | - | කථිකාචාර්ය,<br>ගිරාගම ගුරු මධ්‍යස්ථානය,<br>ගිරාගම,<br>පිළිමතලාව. |
| ඩබ්ලිව්. එම්. රෝහිණී විතුලතා මිය | - | ප්‍රාථමික ගුරු උපදේශක,<br>කලාප අධ්‍යාපන කාර්යාලය,<br>ගිරිඋල්ල, වයඹ පළාත. |
| විපුලි නිරෝෂිණී හෙට්ටිආරච්චි මෙය | - | රාජ්‍ය සම්මාන ලාභී ලේඛිකා<br>(ළමා සාහිත්‍යය) |
| කේ. වී. විමාලි කරුණාරත්න මිය | - | ගුරු සේවය,<br>නාලන්දා විද්‍යාලය,<br>කොළඹ 10. |
| තනුජා නිශාන්ති අයගම මෙය | - | රාජ්‍ය සම්මාන ලාභී ලේඛිකා<br>(ළමා සාහිත්‍යය) |

## චිත්‍ර

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. බී. සියසිරි තෙන්නකෝන් මයා | - | චිත්‍ර කලා ගුරු උපදේශක,<br>කලාප අධ්‍යාපන කාර්යාලය,<br>නිකවැරටිය,<br>පාලුගිබිරියාව,<br>නිකවැරටිය. |

## පිටකවර නිර්මාණය

| | | |
|---|---|---|
| අමිල කෝසල උඩවත්ත මයා | - | ගුරු සේවය,<br>නාගොඩ මහා විද්‍යාලය,<br>කළුතර. |

## පරිගණක අක්ෂර සංයෝජනය හා පිටු සැකසුම

| | | |
|---|---|---|
| හසල චතුරංග විතානගේ මයා | - | පරිගණක අංශය,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 1. | වැව් ඉවුරේ සංගීත පන්තිය | 1 - 2 |
| 2. | ළමයා හා තාරකා | 3 - 5 |
| 3. | නිධානය | 6 - 9 |
| 4. | ඔංචිලි පදිමු | 10 - 12 |
| 5. | හැමෝම දිනුම් | 13 - 14 |
| 6. | වලාකුළේ | 15 - 17 |
| 7. | අලුත් නුවණ | 18 - 19 |
| 8. | සෙල්ලම් ඉස්කෝලේ | 20 - 23 |
| 9. | අපූරු තෑග්ග | 24 - 25 |
| 10. | කඩදාසි මාළුවෙක් හදමු | 26 - 28 |
| 11. | තෝරාලා කිවුවොත් තරු ලකුණු ලැබෙන්නේ | 29 - 31 |
| 12. | කතන්දරයක් කියවමු | 32 - 37 |
| 13. | වවමු වවමු අපිත් වවමු | 38 - 40 |
| 14. | අම්මා තාත්තා ඉර හඳ වාගේ | 41 - 45 |
| 15. | සතුටු චාරිකාව | 46 - 50 |




2.ර.මු.නි.ස. 170417



සවන් දීම, කථා කිරීම, කියවීම, ලිවීම ආදි භාෂා කුසලතා සමෝධානිතව සංවර්ධනය කිරීම අරමුණු කර ගත් මව්බස විෂය නිර්දේශය පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමේ ආධාරකයක් ලෙස මෙම සිංහල වැඩ පොත සම්පාදනය කර ඇත. නව විෂය නිර්දේශය යටතේ සම්පාදිත සිංහල කියවීම් පොතට සමගාමීව නියුක්ත විය හැකි ක්‍රියාකාරකම් මාලාවක් මෙහි අන්තර්ගත වේ. ගුරුවරයාගේ මග පෙන්වීම යටතේ ස්වාධීනව එම ක්‍රියාකාරකම්වල නියැලීමට ශිෂ්‍යයාට ඉඩ ප්‍රස්තාව සලසා දිය යුතු ය.

# 1. වැව් ඉවුරේ සංගීත පන්තිය

පින්තූරය බලා ගැළපෙන වාක්‍යවලට හරි නම් ✓ ලකුණ ද වැරදි නම් × ලකුණ ද යොදන්න.



1. පින්තූරයේ වැවක් තියෙනවා.
2. ළමයි ඔංචිලි පදිනවා.
3. වැවේ ඔරුවක් යනවා.
4. ලොකු ගහක් තියෙනවා.
5. ළමයි පස්දෙනෙක් ඉන්නවා.

පාඩම කියවන්න. සුදුසු වචන තෝරා හිස්තැන් පුරවන්න.

(වැව්, සරුංගල්, කෝච්චියක්, නැව්, බිංදු, සින්දු,)

1. යාළුවෝ ______________ ඉවුරට ආවා.

2. මුහුදේ ලොකු ______________ යනවා.

3. අපි ______________ යවමු.

4. සමන් මොට්ටු වගේ වතුර ______________ ඉහෙනවා.

5. අපි හැමෝම ______________ කියමු.

6. යාළුවෝ ______________ වගේ පේළියට ගෙදර ගියා.



# 2. ළමයා හා තාරකා

පාඩම ඇසුරෙන් හිස්තැන් පුරවන්න.

තරු ______________ ආකාසේ

______________ පිපිලා සේ දිලිසේ

මහ පුදුමයි ______________ පතුලෙත්

පොකුරු පොකුරු ______________ බබළයි

පොළොව යටත් තව ______________

තියෙනවා ද ______________ පුදුමයි

මොකද අනේ ______________ පැංචෝ

______________ ද වෙවුලන්නේ?

පාඩම කියවන්න. අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. තරු පිරී ඇත්තේ කොහේ ද?

2. මල් පිපිලා වගේ දිලිසෙන්නේ මොනවා ද?

3. තරු පිරුණු අහසක් අඳින්න. පාට කරන්න.

පාඩම කියවන්න. හිස්තැන් පුරවන්න.

අකුරු දෙකේ වචන

තරු

අකුරු තුනේ වචන

පොකුරු

අකුරු හතරේ වචන

පුදුමයි

# 3. නිධානය

පාඩම කියවා පිළිතුරු ලියන්න.

1. ගොවියාගේ පුත්තු ගණන කීය ද?

2. නිධානය තිබෙනවා කීවේ කොහේ ද?

3. පුත්තු ධනවත් වුණේ කොහොම ද?

පහත වචන ශබ්ද නගා කියවන්න.

| | |
|---|---|
| නිධානය | ධනවත් |
| ධජය | ආධාර |
| ධීවරයා | ආබාධ |
| අධික | ධර්මය |

සිදුවීම් ගළපන්න. අනුපිළිවෙළින් නැවත ලියන්න.

» වී පැළ වුණා.

» වී වැපුරුවා.

» ගොයම් පැහුණා.

» මිදුලේ වතුර පිරුණා.

» අහස කළු වුණා.

» වැහි බිංදු වැටුණා.

වචන ගළපා වැකි හදන්න.

1. ලෙඩ/පියා/වුණා

2. තියෙනවා/නිධානයක්/කුඹුරේ

3. නැහැ/ නිධානය/ත්/ ලැබුණේ

4. ධනවත්/පුත්තු/හතර දෙනා/ වුණා.



සමාන තේරුම ඇති වචන රවුම තුළින් තෝරන්න. හිස්තැන් පුරවන්න.

වෙල

මහන්සිය

රෝග

කම්මැලි

තාත්තා

1. පියා = ________________

2. වෙහෙස = ________________

3. කුඹුර = ________________

4. අලස = ________________

5. ලෙඩ = ________________

# 4. ඔංචිලි පදිමු

පාඩම කියවා පිළිතුරු ලියන්න.

1. ගම්මැද්දේ නාද කරන්නේ කවුද?

2. ඔංචිල්ලාව බැන්දේ මොන අත්තේ ද?

3. වාරම් ගී කියන්නේ කවුද?



- රූපය බලා වැකි තුනක් ලියන්න.




1. ____________________

2. ____________________

3. ____________________

හල් කිරීම සහිත වචන පාඩමෙන් තෝරා ලියන්න.

රබන්

වාරම්

# 5. හැමෝම දිනුම්

පාඩම කියවා පිළිතුරු සපයන්න.

1. පාසලේ පැවැත්වූ උත්සවය කුමක් ද?

2. දිවීමේ තරගයට සහභාගි වූයේ කුමන ශ්‍රේණියේ සිසුන් ද?

3. දිවීමේ තරගයට සහභාගි වූ අය නම් කරන්න.

මහාප්‍රාණ අක්ෂර සහිත වචන පාඩමෙන් තෝරා ලියන්න.

1. ______________________

2. ______________________

3. ______________________

4. ______________________

ඇලපිල්ල සහිත වචන පාඩමෙන් තෝරා ලියන්න.

1. ______________________

2. ______________________

3. ______________________

4. ______________________

5. ______________________

6. ______________________

# 6. වලාකුළේ

පාඩම කියවා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. මූර්ධජ අකුරක් යෙදුණු වචනයක් තෝරා ලියන්න.

_______________________

2. පාපිලි පමණක් යෙදුණු අකුරු තුනේ වචනයක් තෝරා ලියන්න.

_______________________

3. ඉස්පිල්ල යෙදුණු අකුරු සහිත වචන තෝරා ලියන්න.

    1. _______________________

    2. _______________________

    3. _______________________

    4. _______________________

    5. _______________________

වලාකුළ හා දරුවා අතර ඇති වන දෙබසක් ගොඩ නගන්න.

ළමයා :- වලාකුළේ, ඔයා යන්නේ කොහේ ද?

වලාකුළ :- මම මහ මුහුදෙන් වතුර ටිකක් ගන්න යනවා.

ළමයා :- ____________________

____________________

වලාකුළ :- ____________________

____________________

ළමයා :- ____________________

____________________

වලාකුළ :- ____________________


____________________

වැසි දිනක් අඳින්න.

වැස්ස ගැන වැකි ලියන්න.

# 7. අලුත් නුවණ

රූපයේ කොටස් නම් කරන්න.




1. ____________ 2. ____________

3. ____________ 4. ____________

5. ____________ 6. ____________

7. ____________ 8. ____________

පහත වැකි හරි නම් ✓ ද වැරදි නම් ✕ ලකුණ ද යොදන්න.

1. ගෝණා තමන්ගේ රූපය කවදාවත් දැකලා තිබුණේ නෑ.

2. මගේ අං තට්ටුව හරිම ලස්සනයි ශක්තිමත් කියලා සිංහයා හිතුවා.

3. ගෝණාගේ අං තට්ටුව අත්තක පැටළුණා.

4. සිංහයා ඈත එනවා ගෝණා දැක්කා.

5. ගෝණාට සිංහයාගෙන් බේරෙන්න බැරි වුණා.

# 8. සෙල්ලම් ඉස්කෝලේ

පාඩම කියවා පිළිතුරු ලියන්න.

1. සෙල්ලම් ඉස්කෝලේ ගුරුතුමිය රැගෙන ගිය බෑගය කාගේ ද?

2. පොල් කොළයෙන් හැදුවේ මොනවා ද?

3. සෙල්ලම් ඉස්කෝලේ කියා දුන් දේවල් ලියන්න.

විරුද්ධ තේරුම සහිත පද යා කරන්න.

| | |
|---|---|
| යන | අවලස්සන |
| එහෙට | යන්න |
| ලස්සන | වැරදි |
| එන්න | මෙහෙට |
| හරි | එන |

ඔබේ තොරතුරු ලියන්න.

නම

පාසල

පන්තිය

වයස

ගුරුතුමියගේ නම

ගැළපෙන සේ යා කරන්න.

| ගැහැනු | පිරිමි |
| --- | --- |
| අම්මා | ගුරුතුමා |
| අක්කා | මිතුරා |
| නංගී | මල්ලී |
| ගුරුතුමිය | තාත්තා |
| මිතුරිය | අයියා |

# 9. අපූරු තෑග්ග

පහත වැකි කිවුවේ කවුදැයි ලියන්න.

1. "මනුකට තෑගි දෙන්නේ මොනවා ද?"

(..........................................)

2. "සෙල්ලම් බඩුවක් තෑගි දෙමු."

(..........................................)

3. "සෙල්ලම් කරනවා වගේ ම පොත් කියවන්නත් පුරුදු වෙන්න ඕනෑ."

(..........................................)

4. "රූපියල් අසූ පහයි."

(..........................................)

5. "මට ඕන හීන්සැරය පොතක්."

(..........................................)

පහත රූපයේ ඇති දේවල් නම් කරන්න.



## 10. කඩදාසි මාළුවෙක් හදමු.

පාඩම කියවා හිස් තැන් පුරවන්න.

____________________ බිත්තියේ නිල් පාට

පුවරුවක් එල්ලුවා. ____________________

පේළියට ගොස් ඔවුන් සෑදූ ____________________ නිල්

පාට පුවරුවේ ____________________ . පාට පාට මාළු

පිරුණු ____________________ පොකුණක් වගෙයි.



පහත උපදෙස් හරි නම් ✓ ලකුණ ද වැරදි නම් ✕ ලකුණ ද යොදන්න.

1. "මාළුවෙක් හදමු" ගුරුතුමිය කිවුවා. ☐

2. හැම දෙනාට ම රවුම් කොළය බැගින් ලැබුණා. ☐

3. කොළය ත්‍රිකෝණයක් වන සේ නැමුවා. ☐

4. ත්‍රිකෝණය මත රවුමක් ඇන්දා. ☐

5. ඇඳගත් හැඩය දිගේ පිහියෙන් කැපුවා. ☐


6. නිල් පාට පුවරුවේ මාළුවා ඇලෙවුවා. ☐

7. රවුම් කොළය මැදින් කැපුවා. ☐

8. පුවරුව පොකුණක් වගේ පෙනුණා. ☐

උපදෙස් අනුව චිත්‍රය අඳින්න.

1. තිත් යා කර ත්‍රිකෝණයක් අඳින්න.
2. ත්‍රිකෝණය ඇතුළත හරහට ඉරි ගසන්න.
3. ත්‍රිකෝණය උඩින් එයට ගැටෙන සේ වලාකුළක් අඳින්න.
4. පාට කරන්න.
5. රූපයේ නම ලියන්න.



# 11. තෝරාලා කිවුවොත් තරු ලකුණු ලැබෙන්නේ

පාඩම කියවා එක් එක් තේරවිලි කවිය තෝරා උත්තරය ලියන්න.

1.

2

3

4.

5.

පාඩම කියවා හරි නම් ✓ ලකුණ ද වැරදි නම් × ලකුණ ද යොදන්න.

1. සමනලයා තටු නටවයි. ☐

2. සුළඟට ගස්වල කොළ ගැලවෙයි. ☐

3. රූපවාහිනියෙන් පින්තූර නොපෙනෙයි. ☐

4. දොස්තර මහතා බෙහෙත් දෙයි. ☐

5. ගුරුතුමිය අකුරු ලියයි. ☐

තෝරන්න, තරු ලබා ගන්න.

1. ගහේ ඉන්න මාලු - ______________

2. ගහක් උඩින්
මුවෙක් පැන්නා - ______________

3. නාන්න බැරි විල - ______________

4. දියෙන් උපන් දේ
දියෙන් ම මියැදේ - ______________

5. අකුරු ලියන්නේ
නැති කොළ - ______________




කරවිල, ගොටුකොළ, ආනමාලු, ලුණු, කෙසෙල්මුව

# 12. කතන්දරයක් කියවමු.

පාඩම කියවා පිළිතුරු ලියන්න.

1. කියවීම සඳහා රන් කුඹලා පොත තෝරා ගත්තේ කවුද?

2. සවිඳුගේ ගෙදර සිටින අය කවුරුන් ද?

3. සවිඳු පාඩම් කරන මේසය තියෙන්නේ කොහේ ද?

4. රන් කුඹලාගේ ගෙදර සාදා තිබෙන්නේ මොනවායින් ද?

5. රන් කුඹලාගේ ගෙදර කඩන්න එපා යැයි සවිඳු කීවේ ඇයි?

සමාන තේරුම ඇති වචන යා කරන්න.

| | |
|---|---|
| මව | අහස |
| කුඩා | අලුත් |
| නිවස | අම්මා |
| ප්‍රීතියෙන් | පුංචි |
| ආකාසය | යාළුවෙක් |
| නව | සතුටින් |
| පියා | ගෙදර |
| මිතුරෙක් | තාත්තා |

පාඨම කියවා විරුද්ධ පද යා කරන්න.

| | |
|---|---|
| පරණ | අවලස්සන |
| අපිරිසිදු | දුර |
| ආරම්භ කළා | අලුත් |
| ලොකු | පිරිසිදු |
| ළඟ | අවසන් කළා |
| ලස්සන | පුංචි |

දෙබසක් ගොඩනගන්න.

| | |
|---|---|
| සවිඳු | යාළුවේ, මොනවද ඔය අරන් යන්නේ? |
| රන් කුඹලා | මැටි ගුලියක් |
| සවිඳු | |
| රන් කුඹලා | |
| සවිඳු | |
| රන් කුඹලා | |
| සවිඳු | |

ඔබ කියවූ පොතක් ඇසුරෙන් පිළිතුරු ලියන්න.

1. පොතේ නම කුමක් ද?

2. ඒ පොත ලිවුවේ කවුද?

3. ඒ පොතේ කියවෙන්නේ කවුරුන් ගැන ද?

4. ඒ අය අතුරින් ඔබ කැමති ම කාට ද?

5. කතාවේ ඔබ කැමති ම අවස්ථාව වැකි දෙකකින් ලියන්න.

6. කතාවේ ඔබ කැමති අවස්ථාවක් චිත්‍රයට නගන්න.

# 13. වවමු වවමු අපිත් වවමු.

පාඩම කියවා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. මනුකගේ ගෙදර ගිය යාළුවන්ගේ නම් ලියන්න.

2. කොළ සම්බෝලය රස බව කිවුවේ කවුද?

3. පෝච්චිවල තිබුණු එළවළු මොනවා ද?

4. පුංචි ගෙවත්ත දුටු ෆාරා හිතට ගත්තේ කුමක් ද?

## ශබ්ද නගා කියවන්න.

ආයු එන්න
ලෙඩ නොවෙන්න.
කතොත් මෙන්න
මුකුණුවැන්න

ඇගේ පෙනුම
දියුණු වේවි
ඉසේ රිදුම
දුරු කෙරේවි

ඇගෙ කදිම
ඔප වැඩේවි
ඉබේ නියම
සැප ලැබේවි



රචනය:
ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි

අනුපිළිවෙළට සකස් කරන්න. නැවත ලියන්න.

- පැළය සිටුවන්න.
- සුදුසු බඳුනක් ගන්න.
- බඳුනේ පතුල සිදුරු කර ගන්න.
- පොහොර පස්වලින් බඳුන පුරවා ගන්න.
- ජලය දමන්න. රැක බලාගන්න.

# 14. අම්මා තාත්තා ඉර හඳ වාගේ

පාඩම කියවා පිළිතුරු ලියන්න.

1. කුරුළු පැටවු නිදන්නේ කොහේ ද?

2. කුරුළු පැටවුන් හිනැහෙන්නේ ඇයි?

3. ඉර හඳ වගේ යැයි කියන්නේ කාට ද?

4. නිල් අහසේ තරුවක් වාගේ ඉන්නට කැමති කවුද?

5. "අපේ ලෝකයේ මැණික් පහන වෙන
   කවුරුන්දෝ සුදු පුතා මිස" කිවුවේ කවුද?

පින්තූරයට අදාළ වචනය ලියා වැකි සම්පූර්ණ කරන්න.

1. අපි කඩදාසි  ______________ හැදුවා.


පවනිගේ  ______________ හරි ම ලස්සනයි.

2. බූලා  ______________ අරගෙන දිවුවා.

 ______________ රාක්කය පෙරළුණා.


3.  ______________ මල් පැණි බොනවා.


 ______________ සිරිපාදෙ යනවා කියලා අත්තම්මා කිවුවා.


4. මගේ අලුත් ______  එක එක පාටයි.

ගණිතය  ______ නිල් පාටයි.

5. පුංචි  ______ පීනනවා මනුක දැක්කා.

වතුර පැහැදිලි නිසා  ______ හොඳට පේනවා.

6. මේ  ______ උසයි. වත්තේ උස

 ______ පේළියයි.

එකක් හඟවන පදවලට ගැළපෙන ගොඩක් හඟවන පද යා කරන්න.

| | |
|---|---|
| මිනිසා | බළල්ලු |
| අලියා | පහන් |
| ගොවියා | මිනිස්සු |
| පන්සල | අලි |
| බෝතලය | ගොවියෝ |
| නයා | පන්සල් |
| පහන | බෝතල් |
| බළලා | නයි |

ගැහැනු පිරිමි පද තෝරා ගළපන්න.

1. තාරාවා - ______________________

2. නැන්දා - ______________________

3. සිංහ ධේනුව - ______________________

4. ගෙවිලිය - ______________________

5. කිරිල්ලී - ______________________

6. ඇතා - ______________________

7. පුතා - ______________________

8. වඳුරා - ______________________

වැඳිරිය කුරුල්ලා දුව මාමා ඇතින්න තාරාවි ගොවියා සිංහයා

## 15. සතුටු චාරිකාව

පාඩම කියවා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. චාරිකාව ගියේ කොහේ ද?

2. ගුරුතුමිය ළමයින්ට දුන් අවවාද ලියන්න.

3. ග්‍රහලෝකාගාරය ඈතට පෙනුණේ කුමක් වගේ ද?

4. ගුරුතුමිය හා දරුවන් දිවා ආහාරය ගත්තේ කොහේ දී ද?

5. චාරිකාව ගිය අය ආපසු ආවේ කුමන වෙලාවේ ද?



පාඩම කියවන්න. අනුපිළිවෙළින් ගළපා අංක යොදන්න.

ළමයි නිශ්ශබ්දව වාඩි වුණා. | |

ඔටුන්නක් වගේ ගොඩනැගිල්ලක් ඇතින් පෙනුණා. | 1 |


ළමයි සතුටින් සෙල්ලම් කළා. | |

අහසේ ඉර පායාගෙන එද්දී ශාලාව එළිය වුණා. | |

බස් රථය සතුටු උයන ළඟ නතර කළා. | |

ග්‍රහලෝකාගාර අහසේ චිත්‍රපටියක් දර්ශනය වුණා. | |


සංඥාවට ගැළපෙන වගන්තිය යා කරන්න.



ළමයින් පාර මාරු වන ස්ථානය ඉදිරියෙන්



රෝහල



රථ වාහන ආලෝක සංඥා ඉදිරියෙන්



බස් නැවතුම්පොළ

සුදුසු වචන තෝරා හිස්තැන් පුරවන්න.




1. බස් රථය ගමන ______________________ .

2. ඒ මාමා ______________________ උඩ ඇවිද්දා.

3. ගුරුතුමියගේ ______________________ පැහැදිලිව ඇසුණා.

4. බස් එක සතුටු උයන ______________________ නතර කළා.

5. අමුතු ම ______________________ ඇන්දා.